**පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2015**

---------------------------------------------------

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1985 අංක 02 දරන පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වන වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1. 4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව දේපල, පිරියත හා උපකරණ අයිතම සාධාරණ වටිනාකම් සැලකිය යුතු තරම් වෙනස්වීම් වලින් යුක්ත වන්නේ නම් වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කිරීම අවශ්‍ය වුවත් 2015 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.345,000,000 ක් වූ පර්චස් 92 ක ඉඩම සහ අධ්‍යක්ෂ කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල 2009 වර්ෂයෙන් පසුව තක්සේරු කර සාධාරණ වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය ප්‍රදාන යටතේ ආයතනය වෙත ලැබී තිබූ රු.13,000,000 ක වාහනය රාජ්‍ය ප්‍රදාන වාහන යටතේ ගිණුම්ගතකර තිබූ නමුත් එයට අදාල ක්‍රමක්ෂය වූ රු.10,093,333 ක් වැයකළ ප්‍රාග්ධන ගිණුමට එරෙහිව ලියාහැර තිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් යටතේ තොග ගැලපුම් ගිණුම ලෙස රු.41,505 ක ශේෂයක් පෙන්නුම් කල නමුත් එය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ගැලපුම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මක වූ "සරෙක් ව්‍යාපෘතියට" අයත් ස්ථාවර වත්කම් රු.4,652,248 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබූ නමුත් එම වත්කම් භෞතිකව සත්‍යාපනය කර එහි නිවැරදිතාවය තහවුරු කරගෙන නොතිබුණි. කෙසේවුවද විශ්වවිද්‍යාල වාර්තාවලට අනුව 1988 වර්ෂයේ සිට 2009 දක්වා මෙම වත්කම්වලට අදාලව රු.5,147,572 ක් ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි. මෙම වත්කම් සම්බන්ධව ගිණුම් පොත්වල වූ අඩුපාඩු නිවැරදිකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මේ සඳහා නිලධාරීන් දෙදෙනෙකුගෙන් සමන්විත පරීක්ෂණ කමිටුවක් 2015 සැප්තැම්බර් 23 දින පැවති 266 වැනි කළමනාකරණ මණ්ඩලය විසින් පත් කර තිබුණද 2016 ජුනි 15 දින වන තෙක් එම කාර්යය නිම කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) "සීඩා සරෙක්" (Swedish Agency for Research Corporate with Developing countries) ව්‍යාපෘතියෙන් ලැබිය යුතු රු.79,431 ක මුදල් ශේෂයක් වර්ෂ 10 ට අධික කාලයක සිට මූල්‍ය ප්‍රකාශනයෙහි ඉදිරියට ගෙන එමින් තිබුණි.

(ආ) නිම වූ කොන්ත්‍රාත් වෙනුවෙන් වගකීම් කාලය ඉක්ම වූ රඳවා ගැනීම් මුදල් රු.381,183 ක් හා ආපසු ගෙවිය යුතු ලංසු බැඳුම්කර රු.110,000 ක් 2016 ජුනි 30 දක්වා නිරවුල් කර නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය තුළ වර්ෂ 03 ක් ඉක්මවූ උපදේශක සේවා ගාස්තු රු.215,341 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,059,619 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,412,197 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,471,816 ක වර්ධනයක් දක්නට ලැබුණි. රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.12,588,210 කින් වැඩිවීම සහ පර්යේෂණ හා ව්‍යාපෘති ප්‍රදාන රු.5,272,598 කින් වැඩිවීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ රු.4,045,876 ක්ව පැවති ඌනතාවය 2012 වර්ෂය වනවිට රු.4,243,555 ක අතිරික්තයක් වී තිබුණද 2013 හා 2014 වර්ෂයන්හි නැවත ඌනතාවයක් බවට පත්වී තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී නැවතත් රු.4,059,619 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී රු.28,012,804 ක්ව පැවති 2011 වර්ෂයේ දායකත්වය 2012 වර්ෂයේ සිට 2015 දක්වා පිළිවෙලින් රු.45,284,138, රු.37,451,531 රු.39,708,335 හා රු.58,441,751 ක් විය. ඒ අනුව 2013 වර්ෂයේ දායකත්වය අඩුවීමක් පෙන්නුම් කළද අනෙකුත් වසරවල වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි තත්ත්වයේ ඉගැන්වීම, වෘත්තීය පුහුණුව හා පර්යේෂණ පැවැත්වීම, පුරාවිද්‍යාව පිළිබඳ දැනුම අත්කර ගැනීම, දියුණු කිරීම හා පතළ කිරීම සඳහා ධෛර්ය දීම, පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා සඳහා ඉගැන්වීම හා ප්‍රදානය කිරීම මෙම ආයතනයේ අරමුණු වේ. සමාලෝචිත වර්ෂය තුලදී මෙම අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතනය විසින් පවත්වනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා 05 ක් හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා 02 ක් සඳහා 2014/2015 අධ්‍යයන වර්ෂයට බඳවා ගත් සිසුන් සංඛ්‍යාව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 37 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) පර්යේෂණ දීමනා සඳහා රු.3,111,000 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණු අතර එයින් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 13 දෙනෙකු සඳහා රු.2,701,000 ක මුදලක් පර්යේෂණ දීමනා ලෙස ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ පරිසංවාද කිසිවක් පවත්වා නොතිබුණි.

(ඇ) ආයතනයේ 2015 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුළ ඉටු කර ගත යුතු ප්‍රධාන ක්‍රියාකාරකම් 16 ක් දක්වා තිබුණි. එයින් පහත සඳහන් ක්‍රියාකාරකම් 02 වර්ෂය තුළ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(i) අධ්‍යයන වැඩසටහන් සඳහා විදේශ සිසුන් බඳවා ගැනීම.

(ii) විදේශ විශේෂඥයන්ගේ හා ආයතන වල සහභාගීත්වයෙන් පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීම.

## 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීමට 2006 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලය තුල ලබා දුන් රු.68,171 ක් වූ අත්තිකාරම් මුදල් වලට අදාලව 2015 දෙසැම්බර් 31 දිනට පොත් ලැබී නොතිබුණු අතර එම පොත් නියමිත දිනට ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකසා නොතිබුණි.

(ආ) ආයතනයේ පුරාවිද්‍යාඥයන් සඳහා වාර්ෂික රන් පදක්කම් ප්‍රදානය කිරීමට හා මුදල් ප්‍රදානයන් ලබා දීම සඳහා ආචාර්යවරයෙකු විසින් 2009 වර්ෂයේදී රු.1,000,000 ක මුදලක් ලබා දී තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම අරමුදල උපයෝගී කර රන් පදක්කම් ප්‍රදානය කර නොතිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

මූල්‍ය ප්‍රකාශනවල වෙනත් වගකීම් යටතේ දක්වා තිබූ වැඩ නිම වූ පර්යේෂණ හා උපදේශන ව්‍යාපෘතිවලට අදාළ ඉතිරි ශේෂ හා බාහිර පාර්ශවයන්ගෙන් ලද ප්‍රදානයන් රු.452,581 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් ඌන උපයෝජිතව පැවතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට 27 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | සාධාරණ වටිනාකම ගිණුම්ගත කර නොතිබීම.<br>1995 වර්ෂයේ දී අවසන් වූ සරෙක් ව්‍යාපෘතියට අයත් ස්ථාවර වත්කම් හා ජංගම වත්කම් හඳුනා ගෙන නොතිබීම. |
| (ආ) | පුස්තකාල පාලනය | පුස්තකාල පොත් සමීක්ෂණය කර නොතිබීම. |
| (ඇ) | වාහන පාලනය | වාහන ඌන උපයෝජනය හා ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබීම. |